" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / தொலைநகல் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone } 011 - 2093000

ISO 9001 — SLAB ACCREDITED — ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.10. 13 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2022.10.07 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2022.09.27<br>රා.ප.චක්‍රලේඛ ලිපි 04/2022 | රජයේ නිලධරයන් විසින් සමාජ මාධ්‍ය ජාලා වෙත අදහස් ප්‍රකාශ කිරීම. |
| 02. | 2022.09.27<br>රා.ප.චක්‍රලේඛ ලිපි 05/2022 | රජයේ නිලධරයන්ගේ ඇඳුම. |
| 03. | 2022.09.23<br>රා.ප.චක්‍රලේඛ 21/2022 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් තාවකාලිකව අනුයුක්ත කිරීම . |
| 04. | 2022.09.20<br>විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2022 | රා.ප.ච.14/2022 අනුව විදේශ රැකියා සඳහා විදේශ ගතවන නිලධාරීන්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීමට උපදෙස්. |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

o/c 10/13

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 04/2022

මගේ අංකය : EST-3/DICIP/06/0052
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2022.09.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>රජයේ නිලධරයන් විසින් සමාජ මාධ්‍ය ජාලා වෙත අදහස් ප්‍රකාශ කිරීම</u>

2019.02.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2019 මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ පළමු වැනි කාණ්ඩයේ XXXI වැනි පරිච්ඡේදයේ 3:2 උපවගන්තිය, ආයතන සංග්‍රහයේ දෙවැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 6 වන හා 7 වන වගන්ති සහ "ජනමාධ්‍යයන් වෙත ප්‍රකාශ නිකුත් කිරීම" යන මැයෙන් නිකුත් කරන ලද 2015.01.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2015 වෙත අවධානය යොමු කරවමි.

02. ආයතන සංග්‍රහයෙහි දෙවැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 6 වන හා 7 වන වගන්තීන්හි දැක්වෙන විධිවිධාන අනුගමනය නොකර රජයේ නිලධරයකු විසින් සමාජ මාධ්‍ය ජාලා වෙත අදහස් දැක්වීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2015 හි 03 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි විනයානුකූලව කටයුතු කිරීමට හේතුවන වරදක් වේ.

03. තවද, ආයතන සංග්‍රහයෙහි පළමු වැනි කාණ්ඩයේ XXXII වැනි පරිච්ඡේදයේ 1 වන වගන්තිය අනුව දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම් නොමැති නිලධරයකු විසින් සිදු නොකළ යුතු ක්‍රියාවක්, දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම නොමැති නිලධරයකු විසින් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සිදු කිරීම ද විනයානුකූලව කටයුතු කිරීමට හේතුවන වරදක් වේ.

04. එබැවින් එවැනි නිලධරයන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු වේ.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන : 0112-692159
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : pubad.estad3@gmail.com